# ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල

## ඇබෑර්තු

# විකිරණවේදී විශේෂඥ වෛද්‍ය (Consultant Radiologist) තනතුර

**ඉහත තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

| | | |
|---|---|---|
| **සුදුසුකම්** | : | රජයේ හෝ පෞද්ගලික රෝහල්වල සේවය කරන, කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යායතනයේ (PGIM) විකිරණවේදය පිළිබඳ පශ්චාත් උපාධි (MD Radiology) මණ්ඩල සහතිකය සහිත විශේෂඥ වෛද්‍ය නිලධාරීන් විය යුතුය. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) විශේෂඥ වෛද්‍ය ලේඛනයේ ලියාපදිංචි වී තිබිය යුතු අතර විශේෂඥ ලියාපදිංචි අංකයක් තිබිය යුතුය. |
| **වයස** | : | අයදුම්කරුවන් වයස අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. |
| **වැටුප් කේතය** | : | SL - 03 |
| **වැටුප් පරිමාණය** | : | රු. 210,000.00 - 12 X 6530.00 - 288,360.00/= මසකට. මීට අමතරව රජයේ අංශයේ ගෙවනු ලබන දීමනා සහ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතිරේක දීමනා ද ගෙවනු ලැබේ. |
| **සේවා නියමයන්** | : | ස්ථිර සහ අර්ථසාධක අරමුදල් පදනම සහ සේවක භාරකාර අරමුදල මත වේ. අනුයුක්ත කිරීම් (Secondment) ද සලකා බලනු ලැබේ. |

රජයේ සේවයේ තනතුරු දරන අයදුම්කරුවන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු අතර එහි පිටපතක් සෘජුවම එවිය යුතුය. පත්වීම සඳහා තේරී පත් වුවහොත් අපේක්ෂකයා සේවයෙන් මුදා හැරිය හැකි බවට ආයතන ප්‍රධානියාගෙන් ලබාගත් සහතිකයක් අයදුම්පතට අමුණා තිබිය යුතුය.

පත්වීමක් කිරීම හෝ නොකිරීමේ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල් මණ්ඩලය සතු වේ.

අයදුම් කරන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

අයදුම්කරුවන් තම සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාව (CV) සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) නම් සහිත අයදුම්පත් 2026 ජනවාරි මස 19 වන දින හෝ ඊට පෙර පහත අත්සන්කරු වෙත ලැබෙන සේ එවිය යුතුය.

**සභාපති, ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල,**
**තලපත්පිටිය නුගේගොඩ.**
**2025.12.30**